**පස්සර ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.966,702 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් අතිරික්තය හා ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාල පොත් මිලදී ගැනීමේදී අඩුකළ වට්ටම් සඳහා ලැබුණු රු.32,680 ක පුස්තකාල පොත් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මිල්ලකඳුර ගෙවල් 10 මාර්ගය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ අතරුදවුම් තැන්පත් ගිණුමට බැර නොකිරීම හේතුවෙන් ජංගම වගකීම් රු.37,278 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බැකෝ ලෝඩර් කුලී රු.89,300 ක් වර්ෂයේ ආදායම් හා ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් අතිරික්තය සහ ජංගම වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) **ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු රු.24,597,254 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂයක කාලයක් හිඟහිටි අක්කර බදු රු.267,003 ක්, වර්ෂ 5 ක් හිගහිටි කුලී 136,041,හිඟහිටි වෙනත් ආදායම් රු.2,594,985 ක් හා වර්ෂයක් ගත වූ හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.21,599,225 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.23,027,311 ක් වූ ගෙවිය යුතු ශේෂය තුළ පිළිවෙලින් වර්ෂ 03 ක් වර්ෂ 02 ක් කල්පසු වූ වියදම් ණය හිමියෝ රු.938,468 ක් හා රු.22,049,757 ක්, වර්ෂ 01 ක් කල්පසු වූ විශ්‍රාම වැටුප් ණයහිමියෝ රු.39,086 ක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කර නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.136,825,634 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි වී තිබුණි.

### 1.3.4 අනුකූල නොවීම්

#### 1.3.4.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 217 හා 218 | | සමීක්ෂණ මණ්ඩලයක් විසින් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි. |
| (ආ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) | මුදල් රෙගුලාසි 104(4) | 269,738 | කැබ් රථයකට හා බැකෝ ලෝඩරයකට 2014 වර්ෂයේදී සිදු වී තිබුණු අනතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 189 | 75,712 | 1994 හා 1996 වර්ෂ වලදී කඩකුලී සඳහා ලැබී තිබුණු චෙක්පත් 03 ක් අගරුවී තිබුණද, ඊට අදාළ වටිනාකම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 371 | 88,496 | 2004, 2006 හා 2013 වර්ෂ වලදී සභාව විසින් විවිධ පාර්ශවයන්ට අවස්ථා තුනකදී ලබාදී තිබුණු අත්තිකාරම් ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,166,523 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,444,561 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

සභාවට අයත් ජංගම ගිණුම් 3 ක 2017 වර්ෂය තුළ මෙහෙයුම් කටයුතු වලින් තොරව රු. 3,174,421 ක ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර, එම මුදල් ඵලදායි ආයෝජනයක යෙදවීම කෙරෙහි සභාව සලකා බලා නොතිබුණි.

### 2.2.1 ආදායම් පරිපාලනය

### 2.2.2 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 488,542 | 488,394 | 375,963 | 112,430 | 488,545 | 484,085 | 416,785 | 67,300 |
| (ii) කුලී | 5,614,758 | 6,948,890 | 6,905,348 | 43,542 | 10,420,900 | 7,788,446 | 7,708,596 | 79,850 |
| (iii)බලපත්‍ර ගාස්තු | -- | 695,450 | 695,450 | -- | 699,010 | 699,010 | 699,010 | -- |
| (iv)වෙනත් ආදායම | 2,756,289 | 2,625,490 | 1,377,167 | 1,248,323 | 2,662,999 | 2,747,627 | 1,672,118 | 1,075,509 |
| එකතුව | 8,859,589 | 10,758,224 | 9,353,928 | 1,404,295 | 14,271,454 | 11,719,168 | 10,496,509 | 1,222,659 |

### 2.2.3 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 10.7 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම් රුපියල් මිලියන 9.3 ක් විය. හිඟ ආදායම රුපියල් මිලියන 1.4 ක් වූ අතර, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් අයකර ගැනීම සියයට 14.8 කින් අඩු වී තිබුණි.

2.2.4 **කුලී**

-----

2004 වර්ෂයේ තක්සේරු කුලිය පදනම් කර ගෙන සතිපොළ කඩ කාමර 20 ක් හා බස් නැවතුම්පල කඩ කාමර 08 ක් සඳහා කුලී අයකර තිබුණද, 2017 වර්ෂයේ නව තක්සේරුව මත කුලී අයකර නොතිබුණි.

2.2.5 **බලපත්‍ර ගාස්තු**

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ අංක 149 සහ 159 වගන්ති සහ 2016 දෙසැම්බර් 23 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1999 ගැසට් පත්‍රයේ නියෝග/උපදෙස් අනුව සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කළ යුතු වුවද, 2017 වර්ෂය සඳහා ව්‍යාපාරික ආයතන 12 ක් සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබීම හේතුවෙන් බලපත්‍ර ගාස්තු රු. 15,675 ක් හිඟව පැවතුණි.

2.2.6 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.9,274,013 ක් හා මුද්දර ගාස්තු රු.6,012,556 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කාර්යසාධනය**

-----------------

1987 ප්‍රාදේශිය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

-----------------

1987 ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත්, 2017 දෙසැම්බර් 31 දිනට අතුරු ව්‍යවස්ථා 07 ක් පනවා නොතිබුණි.

(ආ) **ක්‍රියාකාරි සැලැස්ම**

---------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කොම්පෝස්ට් අංගනය ඉදිකිරිම වෙනුවෙන් රු.9,228,219 ක් වැය කර තිබුණද, ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) **පාරිසරික ගැටළු**

------------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව හා2008 ජනවාරි 23 දින අංක 533/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් නිවේදනය අනුව පරිසර බලපත්‍ර ලබාගත යුතු වුවත්, ව්‍යාපාර 27 ක් සඳහා සමීක්ෂණ කටයුතු සිදුකර පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) **තිරසර සංවර්ධන ඉලක්ක**

-------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේදී බැකෝ ලෝඩරය කුලියට දීම වෙනුවෙන් යන්ත්‍ර පැය 227.91 ක් සඳහා රු.435,119 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල පිහිටි ජල ව්‍යාපෘති 12 ක ජල පාරිභෝගිකයින් 812 ක ජල මනු සවි නොකර මසකට රු.100 ක සාමාන්‍ය ගාස්තුවක් හා වාණිජ කටයුතු සඳහා රු.300 ක් අයකර තිබුණි.

3.3 **මානව සම්පත් කළමණාකරණය**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩලය පුරප්පාඩු 04ක් හා අතිරික්ත 24 ක් පැවතුනි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

(අ) **වරිපනම් බදු තක්සේරු කිරීම.**

-----------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු ගම් ප්‍රදේශ හඳුනාගෙන නව වරිපනම් ගාස්තු තක්සේරු කර සභාවේ ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබු අතර, වරිපනම් ගෙවනු ලබන පාරිභෝගිකයින් 1,675 ක් සඳහා නව වරිපනම් තක්සේරු සිදු කර නොතිබුණි.

(ආ) 1980 දෙසැම්බර් 02 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වර්ෂ පහකට වරක් බදු කුලී තක්සේරු කර නොතිබුණි.

3.5. **ප්‍රසම්පාදන**

------------

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

------------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැයගත ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරික්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

05. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරික්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර,පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ශේෂ තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබීම. |
| | | (ii) | ලේඛන නඩත්තු නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබීම. |
| | | (ii) | ඉඩම් හා ගොඩනැඟිලි වල ඔප්පු, පැවරුම් නියෝග නොතිබීම. |
| | | (iii) | ඉඩම් හා ගොඩනැඟිලි වාර්ෂිකව සමික්ෂණය නොකිරීම. |